2024.08.

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## නාට්‍ය හා රංග කලාව

විභාග අංකය : ..............................................

| 07 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

### I කොටස

❖ *සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*

---

❖ **පහත දක්වා ඇති පද්‍ය හා ගද්‍ය කොටස් ඇසුරෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.**

01. නාට්‍යෝචිත අවස්ථාවක් යනු,
    (1) යම් නාට්‍යයක කතා වස්තුවෙන් ප්‍රකාශ වන අදහසයි.
    (2) ප්‍රේක්ෂකයාගේ සිතේ කුතුහලය උපරිමයෙන් කුළුගැන්විය හැකි අවස්ථාවයි.
    (3) නළුවා සහ ප්‍රේක්ෂකයා අතර ඇතිවන අඛණ්ඩ සම්බන්ධතාවයි.
    (4) ප්‍රේක්ෂකයා පිනවීම සඳහා නිර්මාණය කරගත් මුල, මැද, අග සහිත කතාවයි.

02. ඓතිහාසික කතා අන්තර්ගත චිත්‍රපටයක් වන්නේ මින් කුමක් ද?
    (1) සිරි දළදාගමනය (2) සරෝජා
    (3) මාෂා සහ වලහා (4) අඹ යාලුවෝ

03. රංග භූමිය බෙදෙන ප්‍රධාන කොටස් ගණන කීය ද?
    (1) දෙකයි (2) තුනයි
    (3) හතරයි (4) හයයි

04. ශ්‍රව්‍ය මාධ්‍යයකි,
    (1) රූපවාහිනිය. (2) සිනමාව.
    (3) වේදිකා නාට්‍ය. (4) ගුවන් විදුලිය.

05. පරිකල්පනය යනු,
    (1) ශරීරය සැහැල්ලු කර ගැනීමයි.
    (2) අධ්‍යක්ෂ විසින් නළුවන් තේරීමේ ක්‍රියාවලියයි.
    (3) ක්ෂණිකව අවස්ථාවක් නිරූපණය කිරීමයි.
    (4) පෙනෙන, අසන දෙයට වඩා අලුතින් යමක් සිතීමයි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

❖ ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති වාක්‍ය නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් ( × ) ලකුණ ද යොදන්න.

06. වේදිකා නාට්‍යයක ඇති සජීවී ගුණය රූපවාහිනී වැඩසටහනකදී දැකිය නොහැකි ය. (   )
07. පාත්‍ර වර්ගයා යනු නළු නිළියන්ට කියන තවත් නම කි. (   )
08. පරිකල්පන අභ්‍යාසයක් ලෙස වේගවත්ව හා සෙමෙන් ඇවිදීම ගත හැකි ය. (   )
09. ශරීරය සැහැල්ලු කිරීමේ ක්‍රියාවලිය සමාරෝපනය නමින් හැඳින් වේ. (   )
10. 'ටවර් හෝල්' යනුවෙන් ශ්‍රී ලංකාවේ සුප්‍රකට රංග ශාලාවක් ඇත. (   )

❖ ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

11. නළුවරණයේ දී ........................................ භාවිත කරයි.
12. වෙද පුටුව වනාහි ........................................ අභ්‍යාසය කි.
13. බුද්ධදාස රජතුමා නාගයෙකු සුවපත් කිරීමේ අවස්ථාව ........................................ කතාව කි.
14. ........................................ යනු චරිත නිරූපණයේ දී යොදා ගන්නා ඇඳුම් සහ පළඳින ආභරණයි.
15. විද්‍යුත් මාධ්‍යයෙන් විකාශය වන වේදිකා නාට්‍ය හඳුන්වාදෙන වැඩසටහන කි, ...............

(වේෂ භූෂණ / සොඳුරු ආඥාව / පරිකල්පන / ඓතිහාසික / ක්ෂණික නිරූපණ)

❖ අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල "අ" කොටසට ගැළපෙන පිළිතුර "ආ" කොටසින් තෝරා යා කරන්න.

| අ | ආ |
|---|---|
| 16. ජාතක කතා ඇසුරෙන් නිර්මිත නාට්‍ය | සාත්වික අභිනය |
| 17. පොර බදිමින් නැමට නොසිතන්නේ | නාට්‍ය ගීතය |
| 18. කීමට බරවූ හිසකින් යුතු දුක්බර මුහුණ | විද්‍යුත් මාධ්‍ය |
| 19. සුවඳ පදිම ඔලු ආදි | කදා වළලු |
| 20. ශ්‍රව්‍ය - දෘෂ්‍ය | සිරිත් මල්දම |

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ සෙසු ප්‍රශ්නවලින් දෙකක් තෝරාගෙන සම්පූර්ණ ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

(01). පහත පද්‍ය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අයියට නොබණින්, නොගහන් තරහට
අක්කට නොබණින්, නොගහන් තරහට
මල්ලිට නොබණින්, නොගහන් තරහට
නංගිට නොබණින්, නොගහන් තරහට

i. ඉහත පද්‍යය සඳහන් ග්‍රන්ථය නම් කරන්න. (ල. 02)

ii. ඔබ ඉහත නම් කළ එම ග්‍රන්ථ නාමයෙහි තේරුම කුමක් ද? (ල. 02)

iii. එහි රචකයා කවරෙක් ද? (ල. 02)

iv එම කෘතිය මඟින් සමාජයට ලබා දෙන පණිවිඩ මොනවා ද? (ල. 02)

v ඉහත කවියේ දැක්වෙන ලෙස ක්‍රියා නොකළහොත් ඔබට සිදුවන අයහපත් ප්‍රතිඵල දෙකක් ලියන්න. (ල. 02)

(02). i. රංග අභ්‍යාස යනු කුමක් ද? (ල. 02)

ii. රංග අභ්‍යාස වර්ග හතරක් නම් කරන්න. (ල. 02)

iii. රංග අභ්‍යාසවල නිරතවීමෙන් රංගන ශිල්පියෙකුට අත්වන ප්‍රයෝජන විස්තර කරන්න. (රංග අභ්‍යාස ඒ ඒ වර්ගය අනුව ශිල්පියාට වැදගත් වන ආකාරය ලියා දැක්විය යුතු ය). (ල. 06)

(03). i. වේෂ භූෂණ යනු මොනවා ද? (ල. 02)

ii. චරිතවලට උචිත පරිදි නිර්මාණය කළ හැකි වේෂ භූෂණ නිර්මාණයන් තුනක් නම් කරන්න. (ල. 03)

iii. ඔබ ඉහතින් සඳහන් කළ එක් වේෂ භූෂණයක් ඇඳ එය නිර්මාණය කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(04). i. විද්‍යුත් මාධ්‍ය වර්ග දෙකක් නම් කරන්න. (ල. 02)

~~ii. එයින් එක් මාධ්‍යකින් විකාශය වන කලා නිර්මාණ දෙකක් සඳහන් කරන්න.~~ (ල. 04)

iii. රූපවාහිනී නාට්‍ය හා වේදිකා නාට්‍ය අතර ඇති වෙනස්කම් වගුවකින් දක්වන්න. (ල. 04) (වර්ග දෙකේ ම කරුණු අවම වශයෙන් දෙක බැගින්වත් තිබිය යුතු ය).

(05). i. ක්ෂණික නිරූපණ යනු කුමක් ද? (ල. 02)

ii. ක්ෂණික නිරූපණයකදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. (ල. 03)

iii. ක්ෂණික නිරූපණවල යෙදීමේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(ලකුණු 10 x 3 = 30)



REGISTRAR De Mazenod College Kandana.